## 2010-2011 අපගේ නිලධාරි මණ්ඩලය

| | |
|---|---|
| ප්‍රධාන අනුශාසක: | පියාසර කොමදෝරු |
| | නොයෙල් ප්‍රනාන්දු මහතා |
| උප අනුශාසකවරු: | පීටර් කුට්ටාපිටිය මහතා |
| | එම්. ලයනල් ප්‍රනාන්දු මහතා |
| සභාපති: | යමුනා බාලසූරිය මිය |
| උප සභාපති: | අරුන්දතී චන්ද්‍රතිලක මිය |
| ප්‍රධාන ලේකම් : | සී. එච්. සිරිපාල මහතා |
| උප ලේකම් : | නිහාල් බැට්ටගොඩ මහතා |
| භාණ්ඩාගාරික: | දයානන්ද වීරසිංහ මහතා |
| උප භාණ්ඩාගාරික: | වෛද්‍ය උපාලි ප්‍රනාන්දු මහතා |
| නීති උපදේශක: | ඩබ්ලිව්. ඩේවිඩ් වීරරත්න මහතා |
| ගණන් පරීක්ෂක: | නුසිත් කුමාරතුංග සහ සමාගම |
| භාරකාර මණ්ඩලය: | එම්. ජයතිස්ස ප්‍රනාන්දු මහතා |
| | කලාභූෂණ |
| | එල්. ටී. සමරරත්න මහතා |
| සම සංස්කාරකවරු: | වෛද්‍ය ලාල් බාලසූරිය මහතා |
| | ගාමිණී රූපසේන මහතා |
| විධායක කමිටුව: | එච්. එෆ්. ටී. ජී. ගැමුණු මහතා |
| | ආර්. පී. ජේ. වරකාදෙනිය මහතා |
| | නිව්ටන් ඩයස් මහතා |
| | අමිර්ති ජයරත්න මිය |
| | ඉන්ද්‍රානි ප්‍රනාන්දු මෙනවිය |
| | රුවන් රත්නවීර මහතා |
| | කෞශල්‍ය නවරත්න මහතා |
| විධායක කමිටුව: | කපිතාන් එන්. එස්. ජයවර්ධන මහතා |
| | සාම විනිසුරු පර්සි හේමචන්ද්‍ර මහතා |
| | බී. තිස්ස ප්‍රනාන්දු මහතා |
| | ඩික්සන් සමරරත්න මහතා |
| | ඩබ්ලිව්. ඒ. සිරිල් මහතා |
| | කිත්සිරි ප්‍රනාන්දු මහතා |
| | රංජිත් වීරප්පුලි මහතා |
| | මේජර් ප්‍රදීප් උඩුගොඩ මහතා |
| | අනෝමා බාලසූරිය මිය |
| | කපිල මහේන්ද්‍ර ද සිල්වා මහතා |

ප්‍රාදේශීය නියෝජිතවරු:

| | |
|---|---|
| මහනුවර: | ජේ. පී. පද්මසිරි මහතා |
| ගාල්ල: | සාම විනිසුරු වෛද්‍ය |
| | එච්. විලියම් රණසිංහ මහතා |
| මාතලේ: | පියසේන නවරත්න මහතා |
| හෝමාගම: | සාම විනිසුරු |
| | අමරපාල හේවගේ මහතා |
| කුරුණෑගල: | එල්. එන්. ලංකාතිලක මහතා |
| කිරිඳිවෙල: | සාම විනිසුරු |
| | ආර්. හැරී ප්‍රනාන්දු මහතා |
| කොළඹ: | එල්. ආර්. ටී. රණසිංහ මහතා |
| හොරණ: | මහින්ද රත්නවීර මහතා |
| මාතර: | සාම විනිසුරු |
| | එස්. කීර්ති තිලකුමාර මහතා |
| අම්පාර: | ඩී. පී. නන්දසිරි මහතා |
| අනුරාධපුරය: | කේ. එච්. දයාරත්න මහතා |
| මරදගහමුල: | සෙනරත් ගුණවර්ධන මහතා |

**90 වන සංවත්සරයට ඔබ සූදානම් ද? ඒ සඳහා ඔබගේ යෝජනා දැන්ම අප වෙත එවන්න.**

# ශිෂ්‍යාධාර පුවත්

සිය ලංකා ශිෂ්‍යාධාර සමිතිය
29. හඩ්සන් පාර, කොළඹ 03.
ආරම්භය 1920
2010/2011 - අංක 1

අපගේ ලංකා ශිෂ්‍යාධාර සංගමයේ 89 වන වාර්ෂික මහා සභා රැස්වීම 2010 මැයි මස 16 වන ඉරුදින කොළඹ නගර සභාව අසල ජයවර්ධන කේන්ද්‍රයෙහි පැවැත්විණ.



අප සැම බලාපොරොත්තුවෙන් සිටි මෙම වාර්ෂික රැස්වීම මෙවර 300 කට අධික සාමාජික සාමාජිකාවන්ගේ සහ 100 කට අධික ශිෂ්‍යත්වලාභී දරු දැරියන්ගේ සහභාගිත්වයෙන් පැවැත්විනි.



සහභාගිවූවන්ගෙන් ශාලාව පිරී තිබුණු අයුරු ඔබට මෙම ඡායාරූපයන්ගෙන් දැකගත හැකිය.

ඔබට තවමත් අප සමිතියේ ලිපි නොලැබෙයිද? එසේ නම් ඔබගේ ලිපිනය සහ විස්තර අළුත් කර නොමැතිද? 29, හඩ්සන් පාර, කොළඹ 3 හෝ 86/6ඒ, කල්දෙමුල්ල, මොරටුව ලිපිනයන්ට ලියන්න. එසේත් නොමැති නම් දැන්ම අමතන්න 011-2348389 හෝ 011-2625988



අපගේ ශිෂ්‍යත්වලාභීන්ගේ සංඛ්‍යාව වැඩිකිරීමට අපට අවශ්‍ය වුවද මෑතකදී සිදුකළ බැංකු පොළී අනුපාත අඩුකිරීම නිසා එය නොහැකි වී ඇත. අපගේ විශේෂ කැපකරු ශිෂ්‍යත්ව ක්‍රමයට දායකවීමෙන් ඔබටද අප ශිෂ්‍යත්වලාභීන් ප්‍රමාණය ඉහළ දැමීමට හැකියාව දැන් ඇත. මෙහිදී ඔබට එකවර හෝ කොටස් වශයෙන් ගෙවීමෙන් දායක විය හැක.

විශ්ව විද්‍යාල ශිෂ්‍ය: රු 700/- x 12 = රු. 8400.00

අ.පො.ස. උ/පෙළ: රු 450/- x 12 = රු. 5400.00

සා/පෙළ සහ පහළ: රු 400/- x 12 = රු. 4800.00

ඔබත් අප සමිතියේ ක්‍රියාකාරී සාමාජිකයෙකු නම්, නිතර ආධාර කළ අයෙක් නම් හෝ අනුස්මරණ සමරු ශිෂ්‍යත්වයක් ලබාදී ඇත්නම් ඔබටද ශිෂ්‍යත්ව සඳහා දරුවන් යොමුකළ හැක.

මෙවර වාර්ෂික මහා සභා රැස්වීමේදී විශේෂ දේශනය පැවැත්වූයේ අපගේ ඥාතිවර හිටපු රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශ ලේකම් ඔස්ටින් ප්‍රනාන්දු මහතා විසිනි. පරිපාලන ක්ෂේත්‍රයේ ඉහළම තලය වන අමාත්‍යාංශ ලේකම් තනතුර දක්වා ගමන් කළ අපගේ වැදගත් ඥාතිවරයා මෙන් උසස් තත්වයකට ලඟාවීමට අපද උත්සාහ කරමු.



රටේ පවතින ආර්ථික වාතාවරණය මත මෙවර මහා සභා රැස්වීමට පෙර අපගේ විදේශගත සාමාජිකයන්ගේ ආධාර අප පැතුවෙමු. එහිදී අපට සහාය දැක්වූ සාමාජිකයන් මෙසේය.

1 ආනන්ද කොටින්කඩුව මහතා - ඔස්ට්‍රේලියාව
2 රන්ජන් ප්‍රනාන්දු මහතා - ඔස්ට්‍රේලියාව
3 චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා - ඔස්ට්‍රේලියාව
4 වෛද්‍ය එස් එස් කොඩිකාර මහතා - නවසීලන්තය
5 වෛද්‍ය නිහාල් හීනටිගල මහතා - ටැස්මෙනියාව
6 සිසිල් වීරකෝන් මහතා - ඔස්ට්‍රේලියාව
7 චන්දන ප්‍රනාන්දු මහතා - ඇමරිකා එක්සත් ජනපදය
8 වෛද්‍ය හේමාල් කොඩිකාර මහතා - නවසීලන්තය

ඔබගේද පවුලේ අය සහ ඥාතීන් විදේශගතව සිටීනම් ඔවුන්ටද මෙම මාහැඟි අවස්ථාවට දායක විය හැක. දැන්ම ක්‍රියාත්මක වෙමු.

යන්න Log on to www.lankasishya.org වෙත




ඔබ දන්නා ඔබ උදව් කිරීමට කැමැති, ඉගෙනුමෙහි දක්ෂ, අපගේ දරුවන් සිටීද? ඔබගේ ප්‍රදේශය භාර අප ප්‍රාදේශීය නියෝජිත මහතා හමුවන්න. අවශ්‍ය කටයුතු ඔහු සලසාදෙනු ඇත.



මෙවර අපගේ 89 වන මහා සභා රැස්වීමට සහභාගිවූ ශිෂ්‍යත්වලාභීන් - අපගේ අනාගතය - හෙට දින නියමුවන් මේ! ඔබත් ඔවුන්ගේ ජයග්‍රහණයට දායක වුනාද?



මෙයට වසර 90 කට පෙර අපගේ සීමාසහිත ලංකා ශිෂ්‍යාධාර සමිතිය ආරම්භ කළ අවධියේ සිට මේ දක්වා දහස් ගණන් අපගේ දරුවන්ගේ අධ්‍යාපනයට අත්වැලක් වීමට අපට හැකිවිණි. ඒ ඔබගේ නොමඳ සහයෝගය සහ නොමසුරු ආධාරය නිසායි. අප සැමගේ ඉතා කුඩාවූ හෝ ආධාරය අපට මෙම සද්කටයුත්ත තවත් බොහෝ කාලයක් ඉදිරියට කරගෙන යාමට දායක වෙයි. එසේ වන්නේ මේ වනවිට අප සාමාජික සංඛ්‍යාව 1650 ඉක්මවා ගොස් ඇති බැවිනි.

එනිසා **අදම,** තවත් **එක් අයෙකු** - ඔබගේ පවුලේ අයෙකු හෝ ඥාතියෙකු - සමිතියේ සාමාජිකයෙකු කරමු. එවිට අප සාමාජිකත්වය 3000 ඉක්මවනු ඇත. දැනට අප සමිතිය සෑම මසකට රුපියල් 73050.00 කට අධික මුදලක් විශ්ව විද්‍යාල සිසුන් 46 කට අ.පො.ස. උ/පෙළ සිසුන් 41 කට සහ අ.පො.ස. සා/පෙළ හා පහළ ශ්‍රේණි සිසුන් 56 කට පමණ ආයෝජනය කරයි. 2010 අගෝස්තු 29 දින සිට තවත් විශ්ව විද්‍යාල සිසුන් 10 කට අ.පො.ස. උ/පෙළ සිසුන් 12 කට සහ අ.පො.ස. සා/පෙළ හා පහළ ශ්‍රේණි සිසුන් 12 කට ආධාර දීමට තීරණය විය.

නව සිසුන් ගණනාවකට අපට උදව් කළ හැක අවශ්‍ය ඔබගේ උදව්ව පමණි.



ඔබගේ මියගිය ඥාතියෙකු අනුස්මරණය කොට අදම සමරු ශිෂ්‍යත්ව ප්‍රදානියෙකු වන්න. ඒ සඳහා එක්වර හෝ කොටස් වශයෙන් රුපියල් 10000.00 ක් පමණක් පරිත්‍යාග කොට ශිෂ්‍යත්ව සඳහා ළමුන් නිර්දේශ කිරීමට සුදුසුකම ඇතුළුව නොයෙක් හිමිකම් ලබාගන්න.

රුපියල් 5000.00 ක් වසරක් තුළ ප්‍රදානය කර අප සමිතියේ යාවජීව පාලක සහිත සාමාජිකත්වය ලබාගන්න. යාවජීව සාමාජිකයෙකු වීමට නම් රුපියල් 2500.00 ක් ද සාමාන්‍ය සාමාජිකයෙකු වීමට නම් වර්ෂයකට රුපියල් 500.00 බැගින් ද වැය කළ යුතුවේ. මේ සියල්ල ආදායම් බදු වලින් නිදහස්ය. එම ලියාපදිංචි අංකය වන්නේ Act/9/83/93. 1984.10.13 දින ගැසට් අංක 319.

මෙම කලාපයේ සියළුම ඡායාරූප අප සාමාජික මොරටුව, පොල්කොටුව පාරේ, අංක 29, "සෙයාරා ස්ටූඩියෝ" හි අනුර ජයරත්න මහතාගේ කාරුණික අනුග්‍රහයෙනි.

සම සංස්කාරකවරු

වෛද්‍ය ලාල් බාලසූරිය ගාමිණී රූපසේන